## ගීයක රස

# ආදරය කෙතරම් ගැඹුරුද?



මගේ සිත වඩාත් සසල කළ ගීතයක් වෙයි. එය ගයනු ලබන්නේ රුණාරත්න දිවුල්ගනේ විසිනි. රචනා කොට ඇත්තේ රත්න ශ්‍රී විජේසිංහයන්ය. මේ ගීතය සවන් දුන් ඕනෑම අයෙකුගේ සිත තුළ සියුම් සංවේගයක් දනවයි එය රත්න ශ්‍රී විජේසිංහයන්ගේ ප්‍රතිභා ශක්තියයි. මගේ සිත තුළ මේ ගීතයට ඊටත් එහා ගිය අපූර්වත්වයක දනවන කරුණක් වෙයි ඒ රත්න ශ්‍රී ට මෙය පබඳින්නට දිරිගැන්වූ පූර්ව සිදුවීමක් පිළිබඳව අතීතයේ යම් දිනෙක කුමන හෝ මාධ්‍යයකට හෙළි කළා මට මතකය. එය ඉතා සංවේදී සංසිද්ධියකි. ඒ මතකය මා නැවතත් හාරා ඇවිස්සීමි. ඒ සිදුවීම රත්න ශ්‍රී ගේම වදන් වලින් මෙසේයි.

"එක්තරා අවධියක රාජකකාරී කටයුත්තක් සඳහා මට දිවයිනේ පළාත් කීපයක පැවති රැස්වීම් මාලාවකට සහභාගී වෙන්න සිදුවුණා. මින් එක් රැස්වීමක් පැවැත්වුනේ දඹුල්ල අනුරාධපුර පාරෙ කිරලාකුලම හන්දියෙන් හැරිල ගියහම හමුවන තෝඩමඩුව කියන ගමේ ප්‍රජාශාලාවෙ මේ රැස්වීම පැවැත්වෙන අතරවාරෙ මමත් තව මිතුරෙකුත් වතුර ටිකක් බොන්න අසල තිබුන නිවසකට ගියා. එය මධ්‍යම පාන්තික ගෙදරක්. ගෙයි සාලෙ පුරාම මිරිස් ලූනු එළවළු වර්ග ලොකු ලොකු ගොඩවල් ගොඩ ගහල තිබුණා. වත්තෙ කොනක විශාල නුග ගහක් තිබුණා. ඒ නුග ගහයට ලස්සන පහන් පැලක් තිබුණා. ඒ වටේට අලංකාර මල් වවල තිබුණා. බිම ඇමද පිරිසිදු කරල තබුණා.

ඒ ගෙදර හිටියෙ වයසක මාමණ්ඩි කෙනෙක් ඒ මාමණ්ඩිගෙන් අපි ඇහුව වතුර ටිකක් බො-න්න පුළුවන්ද මාමණ්ඩි කියල ඔහු අපට පිරිසිදු වතුර වීදුරු දෙකක් පිළිගැන්නුව. ඉන්පසුව මං ඔහුගෙන් ඇහුව මේ එළවළු විකුණානවද කියල ඔහු අපි දෙන්නටම සෑහෙන්න බෑග්මළු දෙකක් පුරවා එළවළු ගෙනැවිත් දුන්න. මුදල් දෙන්න හැදුවහම ඔහු කිව්ව මට සල්ලි
එපා මහත්තයො තනිකඩ මට සල්ලි ඒ තරම් අවශ්‍ය වෙන්නෙ නෑ කියල

මම නිකමට ඔහුගෙන් ඇහු මොකක්ද අර පහන්පැල මාමණ්ඩි කියල ඔහු එක්වරම හැඟීම්බර වුණා. දිග සුසුමක් හෙළුව. ඔතන නිදාගෙන ඉන්නෙ මගෙ බිරිඳ සුදුබණ්ඩි ඈ ඔතන සැතපෙන්න ගත්ත දා ඉඳල මං ඈ වෙනුවෙන් පහනක් දල්වනව ඒත් ඒ කටයුත්ත වැඩි දොහක් කරරන්න වෙන්නෙ නෑ
මහත්තයො අපි ඇහුව ඒ ඇයි මමණ්ඩි කියල ඔහු කිව්ව. අර එහා ඉඩමෙ ඉන්නෙ මගෙ මලය හේරත් බණ්ඩ එයා මේ ඉඩං වලට නඩුවක් දාල නඩුවෙ හැටියට මැනල මායිං ගහන කොට මගෙ සුදු බණ්ඩි නිදාගෙන ඉන්න කොටහ යන්නෙ ඒ පැත්තට "

ඊට පස්සෙ ඔහු සුදුබණ්ඩි ගැන ලියූ කවි දෙපදයක්ද කීවේලු.

කපා කොටා සිටුවා බටු සිඟිත්තේ

රන්මැණිකා අද නිදි දෝ කනත්තේ
සිදුවීම එපමනකි. ඉන්පසුව ඔවුන් ඒ නිර්ව්‍යාජ ගැමියාගෙන් සමුගෙන යලි කොළඹ බලා පිටත්විය. කොළඹ බලා එන ගමනේදී රත්න ශ්‍රී ගේ සිතෙහි මැවී පෙනුනේ අනාගතයේ යම් දිනෙක දිග බූට්ස් දමාගත් මිනින්දෝරු මහත්වරුන් ජීප් එකකින් බැස විත් පහන් පැලේ මල් ස් පාගා දමමින් ඒ ගැමියා පණමෙන් රැකගත් ආදරය සුනුවිසුනු කර දමන
අන්දමයි එම සංවේදී සිදුවීම මෙවන් අපූරු ගීතයක් නිමැවෙන්නට පිඹුරුපත් සැකසීම අරුමයකි.

ඇය මියගිද ඔහුට ඇයව අමතක කළ නොහැකි හේතු රාශියක් ඇත. ඒ කුඹුරු නෙලන කාලෙට හීල අරන් එන්නේ ඇය වන නිසාවෙනි. හිසේ රුදාවක් හටගත්විට ඒ වෙනුවෙන් හිස තෙල් ගල්වනවා පමණක් නො ඒ ගැ දුක් වන්නේද ඇයයි. ඒ නිසා ඒ දෑත ඔහුට නම් රත්තරන් වටී. ඔවුනට පිහිටට ඇත්තේ එකම උත්තමයෙක් පමණකි. ඒ උඩ ඉන්නා දෙයිහාමුදුරුවන් පමණකි. දෙයිහ-ාමුදුරුවන් පවා තවම ඇය නැති බව දන්නේ නැත දන්නවානම් උන්වහන්සේ විසින් සංහිඳ පාමුල ඇති තෙල් පහන නිවා දමනු නියතය. මේ ගීයේ එම අවස්ථාව ඒ අවස්ථාව එ අසරරණයා වෙනුවෙන් රත්න ශ්‍රී පුද කළ උපාහාරයක් වැනිය. ඇයගේ වෙන්වයාම දෙවියන් පවා උහුලන්නේ නැතිවග ඔහු අනුමත කොට තිබේ. මේ කියැවෙන්නේ ජීවිතයක පතුලට කිඳබැසගත් ආදරයක අරුමයයි.මේ ගීයේ අරුමය පවසන්නට තවත් අටුවා ටීකා අවශ්‍ය නොවේ.ආදර පැහැය මෙයයි. ආදරයේ යථාර්ථය මෙයයි. කනගාටුවට කරුණ නම් මේ ගැඹුරු ආදරය අත්විඳින්නට නූතන සමාජයට පින්මඳ බවයි. නූතන ගැහැණිය මිල මුදල් යස ඉසුරු පසු පස හඹා යයි. ඒ වේගවත් ගමනේදී සිඳී බිඳී යන බැඳීම් බොහෝයි. සදාචාරයන් යුතුකම් වගකීම් මේ සැඩපහරට හසුව සුනු විසුනු වෙයි. පුරුෂයා යනු නො වටිනා මෙවලමක් බවට පත්ව ඇත. හිස විසාදියට තෙල් උලලා තෝන්තුවා වන ගැහැන් මේ සමජයේද නැතුවා නොවේ. එවන් ගැහැනුනන මේ ගී උපහාරක්ම විය යුතුය.

*මිනින්දෝරු කන්තෝරුවෙ මුලාදෑනි ටික*
*සුදුබන්ඩි මගේ නිද ඉන්න සොහොන මනිනවද*
*ඈ ඇහැ ඇරේවි යන්න හොඳයි දම්වැල් අරගෙන*
*තරහ අවසරයි යනවද දම්වැල් අරගෙන*

*පින් කුඹුරු නෙලන කාලෙට මට හීල අරන් එන*
*ඉස විසාදියට තෙල් උලලා තෝන්තුවා වන*
*රත්තරන් දෑත සුදුබන්ඩිගෙ දෙණියේ පස් යට*
*රත්තරන් දෑත සුදුබන්ඩිගෙ දෙණියේ පස් යට*

*දෙයිහාමුදුරුවො දන්නවනම් දැන් ඈ නැති වග*
*තෙල් පාන වුනත් නිවා දමයි සංහිඳ පාමුල*
*වාවන් නෑ මේ දුරුත්ත සංසාරේ තනි මට*
*වාවන් නෑ මේ දුරුත්ත සංසාරේ තනි මට*


පියල් යටවර
"කම්මිත්ත" "අතුරු පාර"
"දොරටු රකින්නෝ" ටෙලි
නට්‍ය අධ්‍යක්‍ෂක
yatawarap@gmail.com
skype — piyal_yatawara





පරිගණක අලුත්වැඩියාව
Professional Services
# Computer Repairs & Upgrades
# Virus Removals
# ADSL Professional installations
# Networking
# Brand New Computers for sales
# Laptop screen repairs
# Trouble shooting Browsing, E-mail & internet connection issues
# All Computer parts for low price
Jithendra Weerakoon
(IT Consultant)
02 Mosstrooper Court
Mill Park
Victoria, 3082
Australia
M: 0422 662 218
T: 03 9005 0893
E: jaytec@tpg.com.au
E: jith710@hotmail.com

Tripple Gem
Video & Audio Production
Videography and Photography
Keep your memories forever
Weddings
Parties
Functions

Vijitha
Tel - 0412 083 876/ 94495635